NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 07 ඒකකය |
|---|---|---|

## ධම්ම පදයෙන් බිඳක්.

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ධම්මපදය අයත්වන නිකාය කුමක්ද?
   (1). දීඝ නිකාය (2). අංගුත්තර නිකාය (3). මජ්ඣිම නිකාය (4). ඛුද්දක නිකාය

02. ධම්මපදය තුළ ඇති වග්ග සහ ගාථා ගණන කොපමණද?
   (1). වග්ග 26 ගාථා 423 යි
   (2). වග්ග 62 ගාථා 424 යි
   (3). වග්ග 26 ගාථා 442 යි
   (4). වග්ග 16 ගාථා 554 යි

03. දේවදත්ත හිමියන් වෙනම පොහොය කර්ම කරන බව දන්වූ විට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධම්මපද ගාථාව කුමක්ද?
   (1). ''අත්තනාව කතං පාපං''........ යන ගාථාවයි
   (2). ''සුකරානි අසාධූනි''........ යන ගාථාවයි
   (3). ''අප්පමාදෝ අමතපදං''........ යන ගාථාවයි
   (4). ''දූරංගමං එකචරං''........ යන ගාථාවයි

04. තම නිවස මං පැහැරූ සොරා යැයි වැරදි වටහා ගැනීමක් නිසා ගෙහිමියන් පිරිසකගේ පහර කෑමට ලක් වූ තැනැත්තා කවුද?
   (1). චුල්ලකාළ උපාසකතුමා
   (2). ධම්මික උපාසකතුමා
   (3). කුම්භඝෝෂකතුමා
   (4). අනාථ පිණ්ඩිකතුමා

05. ''ඇවැත්නි, මම අද පටන් බුදුරජාණන් වහන්සේ හැර දමා මට පක්ෂපාතී සංඝයා සමග පොහොය කරමි. අනෙක් විනය කර්ම ද කරමි.'' දේවදත්ත හිමියන් විසින් ප්‍රකාශ කළේ කාටද?
   (1). අනුරුද්ධ තෙරුන්ටය
   (2). ආනන්ද තෙරුන්ටය
   (3). මුගලන් තෙරුන්ටය
   (4). සැරියුත් තෙරුන්ටය

06. බෞද්ධයාගේ අත්පොත ලෙස ප්‍රකට ග්‍රන්ථය වන්නේ,
   (1). පිරුවාණා පොත්වහන්සේ ය
   (2). ධම්මපදය ය
   (3). ජාතක පොත්වහන්සේ ය
   (4). සද්ධර්ම රත්නාවලිය ය

07. ධම්මපදය ඇතුලත් වන පිටකය වන්නේ,
   (1). සූත්‍ර පිටකයයි
   (2). විනය පිටකයයි
   (3). අභිධර්ම පිටකයයි
   (4). අබිදම් පිටකයයි

08. ''සුකරානි අසාධූනි'' යන ධම්මපද ගාථාව ඇතුළත් වන වග්ගය කුමක්ද?
   (1). අත්ත වග්ගයටය
   (2). යමක වග්ගයටය
   (3). චිත්ත වග්ගයටය
   (4). අප්පමාද වග්ගයටය

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!
agaram.lk

09. බුද්ධක නිකායට අයත් ග්‍රන්ථ ගණන කොපමණද?

(1). 25 කි (2). 15 කි (3). 17 කි (4). 26 කි

10. බිම්බිසාර මහ රජතුමා බුදුරජාණන් වහන්සේට පූජා කළ ආරාමය වන්නේ,

(1). ජේතවනාරාමයයි
(2). වේළුවනාරාමයයි
(3). පූර්වාරාමයයි
(4). නීග්‍රෝධාරාමයයි

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. (1). ''සුකරානි අසාධූනි'' යන ධම්මබද ගාථාව සම්පූර්ණ කරන්න.
(2). එහි සරළ අදහස ලියන්න.
(3). ඉහත සඳහන් කළ ගාථාවේ නිධාන ගාථාව ලියන්න.

02. (1). ''අත්තනාව කතං පාපං'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
(2). එහි සරළ අදහස ලියන්න.
(3). ඉහත සඳහන් කළ ගාථාවේ නිධාන ගාථාව ලියන්න.

03. (1). ධම්මපදයේ වග්ග 3ක් නම් කරන්න.
(2). ඉන් එක් වග්ගයක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
(3). පුද්ගල සුභ සිද්ධිය උදෙසා අදාළ ඉගැන්වීම් පිළිබඳ විස්තරයක් සපයන්න.

04. (1). ආනන්තරිය පාපකර්ම තුනක් ලියන්න.
(2). ඉන් දෙකකට නිදසුන් දෙකක් ලියන්න.
(3). ආනන්තරිය පාපකර්ම පිළිබඳ විස්තරයක් ලියන්න.

05. (1). ලෝවැඩ සඟරාවේ කතුවරයා නම් කරන්න.
(2). ''කරන කලට පව් මිහිරිය මී සේ'' යනකවි පදයේ සරළ අදහස ලියන්න.
(3). පව්කම් කිරීමේ ආදීනව පිළිබඳ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!
agaram.lk